**ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය- 2023**

-------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ ("යෝජනා ක්‍රමය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ 54(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, යෝජනා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය යෝජනා ක්‍රමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී, මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

යෝජනා ක්‍රමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, යෝජනා ක්‍රමය විසින් යෝජනා ක්‍රමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයන් සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස යෝජනා ක්‍රමයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ යෝජනා ක්‍රමයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ යෝජනා ක්‍රමයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, යෝජනා ක්‍රමය ක්‍රියා කර ඇති බව;
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව යෝජනා ක්‍රමය කටයුතු කර ඇති බව; සහ
- යෝජනා ක්‍රමයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. බිලියන 24.1 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු. බිලියන 18.2 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. බිලියන 5.9 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුළ දී මූල්‍ය උපකරණවලින් ලැබුණ පොලී ආදායම ඉහළ යාම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සාමාජික ආයතනවලට ණය ලබාදීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2010 අංක 1 දරණ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රම රෙගුලාසිවල 8.1 (ii) වගන්තිය (2023 නොවැම්බර් 14 දක්වා ක්‍රියාත්මක වන 2021 අංක 2 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රම රෙගුලාසිවල 8.1(ii) වගන්තිය) ප්‍රකාරව, කිසියම් සාමාජික ආයතනයක දැඩි ද්‍රවශීලතා අර්බුදයක් පවතින විටදී එවැනි සාමාජික ආයතනයකට සුරක්ෂිත අත්තිකාරම් හෝ ණය ලබා දෙනු ලැබේ. ඒ අනුව, 2014 දෙසැම්බර් 15 වන දින සාමාජික ආයතනයකට රු. බිලියන 6 ක ණයක් ලබා දී ඇත. ණය මුදලින් රු.මිලියන 186.7 ක මුදලක් 2023 ඔක්තෝබර් 27 දින ලැබුණු අතර,<br>සමාලෝචිත වර්ෂය අවසානයේදී ලැබිය යුතු ණය මුදල රු. බිලියන 1.3 ක් විය. මුදල් ව්‍යාපාරය කරගෙන යාම සඳහා එම සාමාජික ආයතනය වෙත නිකුත් කළ බලපත්‍රය 2020 මැයි 22 දින සිට බලාත්මක වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් අවලංගු කරන ලදී. 2023 දෙසැම්බර් 31 දින දක්වා මෙම ණයට අදාලව රු. බිලියන 1.2 ක හානිකරණ වෙන්කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර තිබුණි. 2023 මාර්තු 21 දින, අධිකරණය විසින් ඈවරකිරීම සඳහා ඈවරකරුවකු පත්කරන ලදි. සාමාජික ආයතනයේ සුරක්ෂිත ණය හිමියකු ලෙස, ගණන් බේරා වසාදැමීම ආරම්භවන දිනට (2021.02.16) හිඟ ණය ශේෂය වෙනුවෙන් වන හිමිකම් ඉල්ලීමක්, 2023 අගෝස්තු 14 දින යෝජනාක්‍රමය ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගණන් බේරා වසාදැමීමේ මුදල් පියවීම කෙරෙමින් පැවතුණි. | සුරක්ෂිත ණයහිමියෙකු වන මෙම යෝජනා ක්‍රමයට, 2019 වසරේ අතිරේක ඇපකරයක් ලෙස එම සාමාජික ආයතනය විසින් යෝජනා ක්‍රමයට උකස් කර ඇති එම සාමාජික ආයතනයේ ප්‍රධාන කාර්යාල දේපළ වලින් එම ණය ශේෂය අයකර ගැනීමට හැකි වන අතර, ඉදිරිපත් කළ හිමිකම් ඉල්ලීම එම දේපලෙන් ආවරණය වේ. | හිඟ ශේෂය අයකර ගැනීමට අවශ්‍ය වේ. |

### 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස්දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යෝජනා ක්‍රමය විසින් ප්‍රාථමික අලෙවිකරුවකු සමඟ රු. මිලියන 147.05 ක මුදලකට 2016 මාර්තු 31 දිනට කල් පිරෙන ප්‍රතිවර්ත ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුමක රු. මිලියන 137.18 ක මුදලක් 2015 අප්‍රේල් 01 දින ආයෝජනය කර තිබුණි. ප්‍රාථමික අලෙවිකරු විසින් ඉහත ආයෝජනය සඳහා පාදක වූ සුරැකුම්පත්, ඒ වෙනුවෙන් කිසිදු සුරැකුම්පතක් ආදේශ නොකර ඉවත් කර ගෙන තිබුණි. ඒ අනුව, ඉහත සඳහන් ආයෝජනය සඳහා රු. මිලියන 144.25 ක් වූ | 2023 මාර්තු මාසයේදී ණය හිමියකු ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුවේ හිමිකම් පෑමේ විස්තර ඇතුළත් අතරමැදි පත්‍රිකා ගොනු කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව එම ප්‍රාථමික අලෙවිකරු ගණන් | පාඩුව අයකර ගැනීමට අවශ්‍යයි. |

| | | |
|---|---|---|
| හානිකරණයක් 2015 දෙසැම්බර් 31 දිනට යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශනවල සිදු කර තිබුණි. 2017 ජූලි 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි රජයේ සුරැකුම්පත් සඳහා වන ප්‍රාථමික වෙන්දේසි කටයුතුවලට සහභාගිවීම අත්හිටුවීමට මෙම ප්‍රාථමික අළෙවිකරු වෙත නියෝග කර තිබුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ 2023 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ හා මෙහෙයුම් වාර්තාව අනුව, අනාරක්ෂිත ආයෝජකයකු විසින් මෙම සමාගම ණයහිමියන්ගේ ස්වෙච්ඡාවෙන් ගණන් බේරා වසාදැමීම සඳහා වන ඉල්ලීමක් කරන ලද අතර අධිකරණය මඟින් 2022 ජූනි 17 දින ගණන් බේරා වසාදැමීම සඳහා වන නියෝගය ලබාදෙන ලදි. කෙසේ වෙතත්, ගණන් බේරා වසාදැමීම සඳහා ගොනු කළ නඩුව (CHC83/2021/CO) වෙනත් නීතිමය ක්‍රියාමාර්ග හේතුවෙන් විභාගවෙමින් පවතී. | බේරා වසා දැමීමේ නඩුවට මැදිහත් විය. එසේම, යෝජනාක්‍රමය 2023 මාර්තු මාසයේදී දිවුරුම් ප්‍රකාශයක් මඟින් එහි හිමිකම් ඉල්ලීම ඉදිරිපත් කරන ලදි. | |

### 3.3 රක්ෂණය කෙරෙන තැන්පතු මත ගෙවිය යුතු වාරික මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 නොවැම්බර් 15 දිනැති 2023 අංක 1 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත් විධාන අංක 1 හි 7 වන වගන්තිය ප්‍රකාරව, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් පිළිගත් පරිදි වාණිජ බැංකු ආසන්නතම පෙර මූල්‍ය වර්ෂය අවසානයේදී විගණිත මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සියයට 14 ක් හෝ ඊට ඉහළින් පවත්වාගෙන යන්නේ නම් වර්ෂයකට සියයට 0.10 ක ප්‍රතිශතයක වාරිකයක් ගෙවිය යුතු සහ අනිකුත් සියලු වාණිජ බැංකු වර්ෂයකට සියයට 0.125 ක ප්‍රතිශතයක වාරිකයක් ගෙවිය යුතුය. කෙසේ වෙතත්, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, එක් එක් මූල්‍ය සමාගමේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සැලකීමකින් තොරව මාසය අවසානයට උපචිත වූ පොලිය ද ඇතුළත්ව සියලු සුදුසුකම්ලත් තැන්පතුවල මුළු වටිනාකම මත වාර්ෂිකව සියයට 0.15 ක අනුපාතයකට මාසිකව ගණනය කර වාරික මුදල් ගෙවිය යුතුය. ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව, තෝරාගත් මූල්‍ය සමාගම් කිහිපයක ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සියයට 4.85 සිට සියයට 95.66 දක්වා පරාසයක පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව, සුදුසු පදනමක් මත එම සමාගම්වලින් අයකළ යුතු වාරික මුදල පිළිබඳව නැවත සලකාබැලීම අවශ්‍ය විය හැකිය. ශ්‍රී ලංකා මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියේ මූල්‍යකරණ ගිවිසුමෙහි සඳහන් කාර්ය සාධනය පදනම්වූ කොන්දේසි ප්‍රකාරව, තැන්පතු රක්ෂණ සංචිතය ගොඩනැංවෙන හා පවත්වාගෙන යාම තහවුරුවන ආකාරයෙන් සාමාජික ආයතන විසින් ගෙවිය යුතු වාරික අනුපාතයට කළයුතු ගැලපීම් සඳහා ක්‍රමවේදයක් මහබැංකුවේ පාලක මණ්ඩලය අනුමත කිරීම සහ එම ක්‍රමවේදයට අනුකූලව වාරික අනුපාතය ගැලපීමට අවශ්‍ය විධාන නිකුත් කිරීම අවශ්‍ය වේ. | බැංකු (විශේෂ විධිවිධාන) පනතේ 55 වන වගන්තිය අනුව, එක් එක් සාමාජික ආයතනයක් විසින්, සුදුසුකම් ඇති මුළු රක්ෂිත තැන්පතු මුදල් ප්‍රමාණය අනුව ගණනය කරන ලද වාරික මුදලක්, මහ බැංකුව විසින් කලින් කලට නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමා සඳහා, යම් අනුපාතයක් මත, යම් අවස්ථාවලදී සහ යම් ආකාරයකින් තැන්පතු රක්ෂණ අරමුදලට ගෙවනු ලැබිය යුතුය. ඒ අනුව, වාරික අනුපාත මෙන්ම ගණනය කිරීමේ ක්‍රමවේදය සුදුසු පරිදි තීරණය කිරීමට ප්‍රතිපත්ති තීරණ වරින් වර ගනුලැබේ. විශේෂ අවස්ථානුගත කරුණුවලදී, මහ බැංකුව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කාලසීමාවක් ඇතුළත යම් අතිරේක වාරික මුදලක් තැන්පතු රක්ෂණ අරමුදලට ගෙවන ලෙස සාමාජික ආයතනවලට නියම කිරීමට මහබැංකුවට අධිකාරී බලය | අවදානම මත පදනම් වූ වාරික ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම ගැන සලකා බැලිම අවශ්‍ය වේ. |

තිබිය යුතුය. මහ බැංකුව, වාරික අනුපාතයට අවශ්‍යවන ගැලපීම් පිළිබඳ ඇගයීමේ ක්‍රියාවලියේ නිරත වේ.

### 3.4 අරමුදලෙන් ගෙවීම් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ රෙගුලාසිවලට අනුව, 2012 ජනවාරි 01 දින හෝ ඊට පසුව මුදල් මණ්ඩලය විසින් බලපත්‍රය අත්හිටුවීම / අවලංගු කිරීම (2023.11.14 දක්වා ක්‍රියාත්මක) පිළිබඳව නියෝග කර ඇති විටකදී වන්දි ගෙවීම බලාත්මක වේ. ඒ අනුව, 2018, 2019, 2020 සහ 2023 යන වර්ෂයන් තුළදී සාමාජික ආයතන හතක බලපත්‍ර මුදල් මණ්ඩලය විසින් අවලංගු / අත්හිටුවීම කරන ලදී. 2021 මාර්තු 19 දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රසිද්ධ කරන ලද ලද පුවත්පත් නිවේදනය අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතනවල බලපත්‍ර අවලංගුකිරීම හෝ අත්හිටුවීම කළ අවස්ථාවලදී එම ආයතනවල තැන්පත්කරුවන්ට උපරිම සහන සැලසීමේ අරමුණෙන් යෝජනා ක්‍රමය යටතේ ගෙවනු ලබන උපරිම වන්දි මුදල රු.600,000 සිට රු.1,100,000 දක්වා රු.500,000 කින් ඉහළ දැමීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය තීරණය කරන ලදි. ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව, මුදල් මණ්ඩලය විසින් බලපත්‍ර අවලංගු කළ/අත්හිටවූ මූල්‍ය සමාගම් 7 ක තැන්පත්කරුවන්ට ගෙවිය යුතු මුළු වන්දි මුදල රු. මිලියන 35,276.3 ක් වූ අතර, ඉන් රු.මිලියන 31,002 ක් හෙවත් සියයට 87.88 ක් 2023 දෙසැම්බර් 31 දිනට යෝජනා ක්‍රමයේ අරමුදලින් ගෙවා තිබුණි. බලපත්‍ර අවලංගු කළ/අත්හිටවූ සාමාජික ආයතනවල සුදුසුකම්ලත් තැන්පත්කරුවන්ට යෝජනාක්‍රමයෙන් වන්දිගෙවීමේ ප්‍රගතිය පහත පරිදි විය. | එකඟ වේ. | ඉතිරි වන්දි මුදල් ගෙවීම අවශ්‍ය වේ. |

| වර්ෂය (බලපත්‍රය අවලංගු කළ/අත්හිටවූ) | සමාගම් සංඛ්‍යාව | ගෙවිය යුතු මුළු වන්දි මුදල (රු.මිලියන) | 2023.12.31 දිනට ගෙවූ වන්දි මුදල (රු.මිලියන) | ගෙවීමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| 2018 | 2 | 4,133.21 | 3,318.46 | 80.3 |
| 2019 | 1 | 1,190.74 | 1,074.31 | 90.2 |
| 2020 | 3 | 29,893.72 | 26,609.95 | 89.0 |
| 2023 | 1 | 58.61 | 0.27 | 0.5 |
| **එකතුව** | | **35,276.28** | **31,002.99** | **88.0** |

### 3.5 සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ගෙවීමට ඇති වගකීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යෝජනා ක්‍රමය විසින් ඉදිරිපත් කරන ලද අභියාචනයට | යෝජනාක්‍රමය, 2024.02.09 දේශීය | ආදායම් |

| | | |
|---|---|---|
| ප්‍රතිචාර වශයෙන් 2023.03.08 දින සහ 2023.11.10 දිනැතිව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් එවන ලද ලිපි මඟින්, 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ 2(ඇ) වගන්තිය ප්‍රකාරව, ආරෝපිත ක්‍රමවේදය භාවිතා කරමින් ගණනය කරන ලද මූල්‍ය සේවාවන්ට ආරෝපණය වන අගය එකතු කිරීමේ සියයට 100 මත, සියයට 2.5 ක අනුපාතයකට සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ගෙවීමට යෝජනාක්‍රමය වගකීමට බැඳෙන බව දක්වා තිබුණි. කෙසේ වෙතත්, යෝජනාක්‍රමය සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ගෙවීම සම්බන්ධව එකඟ වී නොතිබුණු බව නිරීක්ෂණය විය. සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ගෙවීමට යෝජනාක්‍රමයට ඇති වගකීම පිළිබඳව මේ දක්වා අවසන් එකඟතාවයක් නොපැවතුණි. එබැවින්, යෝජනාක්‍රමය, සමාලෝචිත වර්ෂය සඳහා සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් කිසිදු මුදලක් ගෙවා නොතිබුණි. | දිනැති එහි ලිපිය මඟින් පහත තාර්කිකත්වය මත පදනම්ව සිය තීරණය නැවත සලකාබලන ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇත.<br>01. යෝජනාක්‍රමය මූල්‍ය සේවා සැපයීමේ ව්‍යාපාරයක් කරගෙන යනු නොලැබේ.<br>02. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයනු ලබන යම් සේවාවක් සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ නිදහස් කරන ලද සේවාවන්ගෙන් එකක් ලෙස හඳුනාගෙන ඇත. | දෙපාර්තමේන්තුව සමඟ මෙම කාරණය ඉක්මනින් නිරාකරණය කරගැනීම අවශ්‍ය වේ. |

### 3.6 සාමාජික ආයතන විසින් වාරික ගෙවීම පැහැර හැරීම වෙනුවෙන් දඩ ගෙවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 නොවැම්බර් 15 දිනැති 2023 අංක 1 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත් විධානයේ 7(iii) වගන්තිය ප්‍රකාරව, කිසියම් සාමාජික ආයතනයක් විසින් ගෙවිය යුතු වාරික ගෙවීමේදී කිසියම් පැහැර හැරීමක් සිදු කරන විට, එම සාමාජික ආයතනය එම පැහැර හැරීමේ කාලසීමාව සඳහා දඩයක් ලෙස මහබැංකුවට ගෙවීමට බැඳී සිටියි. කෙසේ වෙතත්, දඩ මුදල් ගෙවිය යුතු නිශ්චිත කාල සීමාවක් එකී විධානයේ නියම කර නොතිබුණි. | සාමාජික ආයතනවලට නිකුත් කිරීමට නියමිත ඉදිරි විධානවලදී, පැහැර හරින ලද මුදල මත නියමිත දඩ මුදල පියවීම වෙනුවෙන් නිශ්චිත කාල සීමාවක් සම්බන්ධ විධිවිධාන ඇතුළත් කිරීමට අපේක්ෂා කෙරේ. | දඩය ගෙවිය යුතු කාල සීමාව සඳහන් කිරීම අවශ්‍ය වේ. |

### 3.7 මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය 2024.01.31 දින, මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ඇ.එ.ජ.ඩොලර් මිලියන 150 ක (විශේෂ ගැණුම් හිමිකම් 112.8 කි) සහනදායී මූල්‍යකරණයක් සඳහා මූල්‍ය ගිවිසුමකට එළඹුණි. තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳව අවධානය යොමුකරමින් ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලයේ මූල්‍ය හා ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ පරමාර්ථය වේ. යෝජනාක්‍රමය ප්‍රාග්ධනීකරණය, ශ්‍රී ලංකා මහ බැංකුවේ ආයතනික ධාරිතාවය ගොඩනැංවීම, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම යනාදි වශයෙන් ව්‍යාපෘතිය කොටස් තුනකින් සමන්විත වන අතර ඒවා 2024 සිට ඉදිරියට ක්‍රියාත්මක කරනු ලැබීමට අපේක්ෂා කෙරේ. | ඵලදායී තැන්පතු රක්ෂණ පද්ධති සඳහා, ගෝලීය හොඳම භාවිතයන්ට අනුකූලව යෝජනාක්‍රමයේ ආයතනික හා මූල්‍ය ධාරිතාවය ඉහළ දැමීම ව්‍යාපෘතියේ අරමුණ වේ. | ක්‍රියාත්මක කරනු ලබන කාලසීමාව තුළදී පරමාර්ථ ළඟාකර ගැනීම අවශ්‍ය වේ. |